# මගේ සතුට සමාජයට සේවය කිරීමයි

## චන්ද්‍රසිරි දයාසෝම බමුණුසිංහ



**ශ්‍රීනාත්**
අපට දැනගන්න ලැබුණා ඔබ ශ්‍රී ලංකා ප්‍රජාවට කරන සේවය වෙනුවෙන් සම්මානයෙන් පුද ලැබුවා කියලා . අපේ සාකච්ඡාව එතනින් පටන් ගමු ද?

**දයාසෝම**
මෙවර සම්මානයට පාත්‍රවුණ කීප දෙනෙක් අතරින් මටත් ශ්‍රී ලංකාවේ ප්‍රජාවට කළ සේවය වෙනුවෙන් නොවැම්බර් 26 වන දා වික්ටෝරියානු ආණ්ඩුකාර ජෝන් ඩි ක්‍රෙස්ට් මහතා අතින් සම්මානයක් ලැබුණා. මේ ගැන මම සතුටු වෙනවා. නමුත් මම ප්‍රජා සේවය කළේ සහ ඉදිරියට කරන්නෙත් මෙවැනි සම්මාන අගැයීම් බලාපොරොත්තුවෙන්නෙවෙයි. මම හිතනවා අපි ජීවත් වන ප්‍රජාවට අපට හැකි අයුරින් සේවාවක් කළ යුතුයි කියලා. එසේ සේවාවක් කරන විට නොදැනුවත්වම සම්මානයට පාත්‍ර වෙනවා.

**ශ්‍රීනාත්**
ඔබේ සමාජ සේවා කටයුතු ආරම්භ වුණේ මොන කාලයේදි ද?

**දයාසෝම**
මම ඔස්ට්‍රේලියාවට ආවේ 1987 මාර්තු මාසේ. ඉන් පස්සේ ජර්මාණු කාර්මික අභ්‍යාස ආයනයේ ආදි ශිෂ්‍ය සංගමයේ ආරම්භක භාණ්ඩාගාරික වුණා. 1991 ජූලි 7 වන දා මේ සංගමය ආරම්භ කළා. ඊට පස්සේ 2001 වසරේ උපසභාපති තනතුරට පත් වුණා.

**ශ්‍රීනාත්**
එහිදී කළ විශේෂ දේ තියෙනවද?

**දයාසෝම**
මට මතක් වෙනවා එවකට සභාපතිව සිටි සුනිල් පෙරේරා මහතා සහ අනිත් සගයන් සමග එකතු වී මෙහි තියෙන විශේෂම උත්සවය වන අවුරුදු උත්සවය ඩැන්ඩිනොන් ප්‍රදර්ශණ ක්‍රීඩා පිටියට ගෙනියන්න අපට හැකි වුණා. ඒ එක්කම ඩැන්ඩිනොන් පුස්තකාලයේ සිංහල අංශයක් ආරම්භ කරන්න අපට හැකි වුණා. අපට විහාල පොත් ප්‍රමාණයක් ගෙන ඒමට අනුග්‍රහය ලබා ගැනීමට අපට හැකි වුණා.

මේ කරුනු කාරණා මට හැම තිස්සෙම මතක් වෙනවා.

**ශ්‍රීනාත්**
වෙන සංවිධාන වලට ඔබ සම්බන්ධ වුණේ නැද්ද?

**දයාසෝම**
2002 වසරේ බ්‍රන්ස්වික් ශ්‍රී ලංකා ප්‍රජා සංගමයට සම්බන්ධ වෙලා එහි පබ්ලික් ඔෆිසර් හැටියට වැඩ කළා. මේ කාලයේදී මට මතක් වෙනවා සිංහල පාසල අපේ ප්‍රජාව වැඩි වශයෙන් ජීවත් වන ස්ථානයක් වන දැන් තියෙන ස්ථානයට ගෙන ඒමට හැකි වීම.

**ශ්‍රීනාත්**
උතුරු වික්ටෝරියානු සුබසාධක සංගමයටත් ඔබේ සම්බන්ධයක් තිබෙනවා නේද?

**දයාසෝම**
ඔව්. අපි 2003 වසරෙදි මේ සුබසාධක සංගමය ආරම්භ කළා. ප්‍රධාන අරමුණ වුණේ වික්ටෝරියාවේ බටහිර ප්‍රදේශයේ වාසය කරන ශ්‍රී ලාංකිකයන්ට අවශ්‍ය පහසුකම් සපයා දීම. විශේෂයෙන්ම අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා සහය දීම. 2006 හා 2007 වර්ශ වලදී මම එහි සභාපති ලෙස කටයුතු කරනවා. මේ වසරේදී අපි වැඩිපුර ළමයින්ගේ ශිෂ්‍යත්ව විභාග වලට අවශ්‍ය පසුබිම් සහ වැඩිහිටියන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් සළසන්න බලාපොරොත්තු වෙනවා. වැඩිහිටියන් වෙනුවෙන් දිවා විහරන වැඩ සටහනක් ආරම්බ කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘති කීපයක් කිරීමට මේ දිනවල සැළසුම් කරනවා. ඒ එක්කම මට කියන්න සතුටුයි අපේ උතුරු විකටෝරියානු සුබසාධක සමිතියේ සියලුව සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් වල අයගේත් නිලධාරීන්ගේත් අපරිමිත කැපවීම නිසා අපට විශාල වැඩ කොටසක් මේ වන විට කරන්න පුලුවන් වෙලා තියෙනවා. විශේෂයෙන් මතක් කරන්න ඕනෙ මාර්ටින් වික්‍රමසිංහ උපහාර උළෙල කේ ජයතිලක උපහාර උළෙල සන්නස පුවත්පත මෙහෙයවූ සාහිත්‍ය තරගාවලියේ අවසාන උත්සවය අපට සාර්ථකව කරන්න ලැබුණා. මම මේ අවස්තාවක් කර ගන්නවා එයට උදව් කළු සියලු දෙනාටම ස්තුති කරන්න. නම් වශයෙන් කියන්න ගියොත් විශාල සංඛ්‍යාවක් වෙනවා.

**ශ්‍රීනාත්**
ඔබ දේහපාලනමය වශයෙන් යම් යම් ආයතන වලට උපකාර ලබා දෙන්න නොපැකිළ ඉදිරිපත් වෙනවා නේ ද?

**දයාසෝම**
මම රාජ්‍ය සහයෝගය අවශ්‍ය වෙලාවලදි මට හැකි පමණින් උදව් උපකාර ලබා දී තිබෙනවා. මේ කටයුතු වලට වික්ටෝරියාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ ලේකම් ලිස් බීටි මහත්මිය හුගාක් උපකාර කරලා තියෙනවා. මේ වෙලාවේ ඇයත් මතක් කරන්න ඕනෙ. ඒ එක්කම ඔස්ට්‍රේලියානු කම්කරු පක්ෂයේ ක්‍රැගිබර්න් ශාඛාවේ සභාපති ධුරය මම හොබවනවා. මගේ බලාපොරොත්තුව තමයි අපේ තරුණ තරුණියන් වැඩි වශයෙන් දේශපාලනයට යොමු කිරීම. දැනටමත් එය මා ක්‍රියාත්මක කර තිබෙනවා.

**ශ්‍රීනාත්**
ඔබේ අදහසක් නැද්ද දේශපාලනයට පිවිසෙන්න?

**දයාසෝම**
අවස්තාවක් ලැබුණොත් මා බාලපොරොත්තු වෙනවා දේශ්පාලනයට පිවිස මගේ දැන් කරන කාර්යයන් තවත් සාර්ථකව කරන්න. මේ සඳහා හැකි වුණොත් මම දේශපාලනයට එනවා. ඒ ගැන ඉදිරියේදී කතා කරමු.

**මුහුණට මුහුණ**

**ශ්‍රීනාත් මද්දුමගේ**

**ශ්‍රීනාත්**
ඔබ සම්බන්ධ වී සිටින වෙනත් සංවිධාන මොනවාද?

**දයාසෝම**
මම ස්කැට්ස් සංවිධානයේ බටහිර ශාඛාවේ ක්‍රියාකාරිකයකු ලෙස කටයුතු කරනවා. මෙහිදී මතක් කරන්න ඕනෙ ගාමිණී පෙරේරාත් ශ්‍යාමොන් ජයසිංහ යන මහත්වරුනුත්. එයට අමතරව 3zzz ගුවන් විදුලියේ පාලක මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් හැටියටත් සම්බන්ධ වෙලා ඉන්නවා. 3zzz සිංහල සේවයේ 2006 වසරේ උප කැඳවුම් කරු වශයෙන් ද කටයුතු කරනවා.

**ශ්‍රීනාත්**
මෙවැනි කටයුතු සඳහා ඔබ වෙලාව හොයා ගන්නෙ කොහොමද?

**දයාසෝම**
අවශ්‍යතාව තියෙනවා නම් කැපවීම තියෙනවා නම් යම් යම් පෞද්ගලික කැපවීම් කර කාලය හොයාගන්නට පුලුවන්. නමුත් අමාරුයි. ඒකට පවුලේ සහ හිත මිත්‍රයන්ගේ සහයෝගය අවශ්‍යයි. මගේ පවුලේ









අයගෙන් මට ලැබෙන සහ විශාලයි. මගේ බිරිඳ තමරා පුතා නිශාන් සහ සචේතා හා චමති දුවලා මට විශාල සහයෝගයක් ලබා දෙනවා. ඒ නිසා මේ කටයුතු කරන්න මට පහසුයි.

**ශ්‍රීනාත්**
ඔබේ රැකියාව ගැන කතා කරමු ද?

**දයාසෝම**
මම දැනය ක්වොන්ටාස් ගුවන් සමාගමේ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු වරයෙකු ලෙස සේවය කරනවා

**ශ්‍රීනාත්**
ඔබේ මේ ගමනට උදව් කළ අය කව්ද?

**දයාසෝම**
විශාල ප්‍රමාණයක් ඉන්නවා.

කැම්බෆීල්ඩ් විහාරස්ථානයේ විහාරාධිපති හොරොව්පතානේ සතින්ද්‍රීය ස්වාමීන් වහන්සේ බන්දු දිසානායක විරාල් මාකස් මහත්වරු ඩබ් හේමචන්ද්‍ර අයි ඩී පියරත්න මේ මගේ ගුරුවරු. මේ අය ගැන මතක් කරන්න ඕනෙ. තිලක් පීරිස් සමන් රන්වලගේ ජූඩ් පෙරේරා රත්නපාල දිසානායක ගාමිණී පැළෑඳ දසුන් ගජමන් ජගත් ජේ එදිරිසිංහ ශර්ලි අමරසිංහ මරියා වැකිනෝ ඩිල්ෂාන් ප්‍රනාන්දු යන අයත් මතක් කරන්න කැමතියි. ඒ එක්කම උතුරු වික්ටෝරියානු සුබසාධක සංගමගේ සියලුම සාමාජිකයන් හා පවුලේ අය ත් ආදරයෙන් මතක් කරනවා. 3zzz ගුවන් විදුලියේ නිමල් ඒකනායක විල්ෆ්‍රඩ් සිරිවර්ධන ප්‍රසන්න කුරුකුලරත්ත් මතක් කරන්න කැමතියි. තව උදව් කළ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මේ සම්මානයත් සමග මට ලැබුණ ප්‍රසංසාව ඒ ඔක්කෝටම හිමි වෙනවා.

**ශ්‍රීනාත්**
ඔබේ ඉදිරි දේශපාලන කටයුතු සමාජ සේවා කටයුතු තවත් සාර්ථකව කරගෙන යන්නට සන්නස වෙනුවෙන් මම සුබ පතනවා.


**ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා**



Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

**DENTIST**

**Facilities are also available for :**
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

Sannasa

**1254 Plenty Road, Bundoora 3083**
**Tel : 03 9467 7760**